සැ. යු.- 2015.10.16 දින පළ වූ අංක 1,937 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,938 - 2015 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2015.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 1098 |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 13 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම්

### කොළඹ දිසා අධිකරණයේ දී ය

1994 අංක 9 දරන පනතින් සංශෝධිත 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් හා සම්බන්ධ කාරණය පිළිබඳවයි.

*නඩු අංකය :* DDR/194/2014
*ස්වභාවය :* ණය අයකර ගැනීම
*වටිනාකම :* රු. 49,736,390/41.
*ක්‍රියාපටිපාටිය :* 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ ක්‍රියා පටිපාටිය අනුව.

සොෆ්ට්ලොජික් ෆයිනෑන්ස් පීඑල්සී,
අංක 01, ලේක් චන්ද්‍රවංකය,
කොළඹ 02.

නව ලිපිනය : 2 වන මහල, අංක 33, උද්‍යාන පාර, කොළඹ 03.

..............................................පැමිණිලිකරු.

*එදිරිව*

1. ශාන් හොලිඩේ ප්‍රයිවට් ලිමිටඩ්
2. නාගාරාජා සෙබමලෙයි
3. සෙබමලෙයි ස්ටීවන් ක්‍රිෂාන් සෙබමලෙයි,

තිදෙනාම : අංක 27, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01.

..........................................විත්තිකරුවන්.

වර්ෂ 2015 ක් වූ ජූනි මස 11 වැනි දින ඉහත අංක දරන නඩුවේ නියත කර ඇති නෛසයි තීන්දු ප්‍රකාශය ප්‍රකාර, එනම් වර්ෂ 2014ක් වූ අගෝස්තු මස 19 වැනි දිනට ශ්‍රී ලංකා රුපියල් හාරසිය අනූහත් ලක්ෂ තිස්හය දහස් තුන්සිය අනූවක් සහ ශත හතළිස් එකක (රු. 49,736,390/41) මුදලක් හා එකී මුදලේ මුල් මුදල (පොලිය හැර) වන ශ්‍රී ලංකා රුපියල් හාරසිය අසූ ලක්ෂ (රු. 48,000,000) ක මුදලක් මත තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා සියයට විසිහතර (24%) ක පොලියක් ද, තීන්දු ප්‍රකාශිත දින සිට තීන්දු ප්‍රකාශිත සම්පූර්ණ මුදල මත අදාල නෛතික පොලිය ද, එම මුදල අයකර ගැනීම සඳහා සංශෝධිත වූ පරිදි 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව එකී විත්තිකරුවන්ට විරුද්ධව ඇතුලත් කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තු ද එකී විත්තිකරුවන් විසින් එකී පැමිණිලිකරු හට ගෙවිය යුතු බවට ආඥාකොට තීන්දු ප්‍රකාශ කර ඇත.

තව ද, එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට ඉහත නම් සඳහන් (2) වන විත්තිකරු වන නගරාජා සෙබමාලෙයි යන අය අපොහොසත් වී ඇති හෙයින්, මවිසින් නිසි ලෙස ලියා තහනමට ගෙන ඇති එකී (2) වන විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපලෙහි හිමිකම්, අයිතිවාසිකම් ඇතුළු සියළු දේ, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. ආර්. පී. කුමාරි මහත්මිය විසින් පිලිවෙළින් සෙලාන් බැංකුව වෙත ලියා සහතික කර ඇති 2011.06.08 වැනි දින අංක 1241 හා 2012.06.29 වැනි දින අංක 1455 දරන උගස්කරයන්ට යටත්ව, වර්ෂ 2015ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින පෙ. ව. 10.00ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල පිහිටීම.-* කොළඹ සිට ගාලු පාරේ හමුවන ගල්කිස්ස හන්දියට ආසන්නව දකුණු පසින් වැටී ඇති හරස් පාරේ මීටර් 200ක් ගමන් කළ විට වම් පසින් පිහිටි වරිපනම් අංක 19 යනුවෙන් හඳුන්වනු ලබන 'ශාන් ට්‍රේඩර්ස් ඩිස්ට්‍රිබියුටර්ස්' නමින් වන 'කොකා කෝලා' බීම බෙදාහරින සමාගම පවත්වන ස්ථානයේ මෙම දේපල පිහිටා ඇති අතර, එයට පහසුවෙන් ළඟාවිය හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් 25% ක් ද, පළාත් පාලන ගාස්තු ලෙස විකුණුම් මිලෙන් 1% ක් ද, සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වැනි වගන්තිය ප්‍රකාරව පිස්කල්ගේ ගාස්තු ද, විකුණුම් සඳහා වන සියළුම ද, එවෙලේම මුදලින් ගෙවිය යුතු ය.

තව ද, ගැණුම් මිලෙන් ඉතිරි 75% ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් 30 ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

### *උපලේඛනය*

බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළය, පල්ලේ පත්තුව, දෙහිවල - ගල්කිස්ස මහනගර සභා බල ප්‍රදේශය තුළ ගල්කිස්ස හරස් පාර අංක 19 දරන වරිපනම් අංක හිමි වෝඩ් අංක අංක 18, ගල්කිස්සේ පිහිටි ''නුගගහවත්ත'' හා ''බෝමිරියවත්ත'' හෙවත් ''ගල්කිස්සවත්ත'' කියන ඉඩමට බලයලත් මානක ඒ. ජී. ප්‍රනාන්දු මහතාගේ 1994 සැප්තැම්බර් 7 දතමැති අංක 1727 දරන පිඹුරේ අංක 1ඒ යනුවෙන් දක්වා ඇති කොටස : උතුරට : හෝටල් පාර සිට ගාලු පාරට වන හරස් පාර ද, නැගෙනහිරට : කැබලි අංක 1 සී ද, (අඩි 12 පළල පාරකට වෙන් කර ඇති කොටසත්), දකුණට : මෙහිම කැබලි අංක 1බී හා බස්නාහිරට : අබේවික්‍රම මාවතේ අංක 1 දරන පරිශ්‍රය ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහහතරක් හා දශම පහයි පහක් (අ. 0, රූ. 0, පර්. 14.55) වන අංක 19 දරන නිවසේ බෙද වෙන්කළ ඉඩම් කොටස ගහකොල පලතුරු ආදී සියළු දේත් සමග වන අතර, ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක එම්. 2027/21 යටතේ ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළය, පල්ලේ පත්තුව, දෙහිවල - ගල්කිස්ස මහනගර සභා බල ප්‍රදේශය තුළ, ගල්කිස්ස හරස් පාර, අංක 19 දරන වරිපනම් අංක හිමි වෝඩ් අංක 18 ගල්කිස්සේ පිහිටි ''නුගගහවත්ත'' හා ''බෝමිරියවත්ත'' හෙවත් ''ගල්කිස්සවත්ත'' කියන ඉඩමට බලයලත් මානක ඒ. ජී. ප්‍රනාන්දු මහතාගේ 1994 සැප්තැම්බර් 7 දතමැති අංක 1727 දරන පිඹුරේ අංක 1බී යනුවෙන් දක්වා ඇති කොටස උතුරට : මෙහිම කැබලි අංක 1ඒ හා 1සී ද, නැගෙනහිරට : අංක 954 දරන පිඹුරේ කැබලි අංක 2 ද, දකුණට : අබේවික්‍රම මාවතේ අංක 3 දරන පරිශ්‍රය හා බස්නාහිරට : අබේවික්‍රම මාවතේ අංක 1 දරන පරිශ්‍රය ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහසයයි දශම එකයි හතක් (අ. 0, රූ. 0, පර්. 16.17) වන අංක 19 දරන නිවසේ බෙද වෙන්කල ඉඩම් කොටස ගහකොල පලතුරු ආදී සියළු දේත් සමග වන අතර, ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක එම්. 2027/22 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත දක්වා ඇති පරිදි කැබලි අංක 1සී දරන කොටස මතින් වන මාර්ග අයිතිය ද සමග වේ.

බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළය, පල්ලේ පත්තුව, දෙහිවල - ගල්කිස්ස මහනගර සභා බල ප්‍රදේශය තුළ, ගල්කිස්ස හරස් පාර, අංක 19 දරන වරිපනම් අංක හිමි වෝඩ් අංක 18 ගල්කිස්සේ පිහිටි ''නුගගහවත්ත'' හා ''බෝමීරියවත්ත'' හෙවත් ''ගල්කිස්සවත්ත'' කියන ඉඩමට බලයලත් මානක ඒ. ජී. ප්‍රනාන්දු මහතාගේ 1994 සැප්තැම්බර් 7 දතමැති අංක 1727 දරන පිඹුරේ අංක 1සී යනුවෙන් දක්වා ඇති කොටස උතුරට : හරස් පාර ද, නැගෙනහිරට : අංක 954 දරන පිඹුරේ කැබලි අංක 2 ද, දකුණට : මෙහිම කැබලි අංක 1බී හා බස්නාහිරට : මෙහිම කැබලි අංක 1 ඒ යන කොටස ද, යන මායිම් තුළ පිහිටි පර්චස් තුනයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 3.48) වන අඩි 12ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද කොටස, මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක එම්. 2027/23 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී කැබලි අංක 1ඒ, 1බී හා 1සී යන කොටස් බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළය, පල්ලේ පත්තුව, දෙහිවල-ගල්කිස්ස මහනගර සභා බල ප්‍රදේශය තුළ වෝඩ් අංක 8 ගාලු පාර වරිපනම් අංක 18 දරන කොටසට බලයලත් මානක ඩබ්ලිව්. එම්. පෙරේරා මහතාගේ 1967 නොවැම්බර් 10 දාතමැති අංක 954 දරන පිඹුරේ දක්වා ඇති කැබලි අංක 1 දරන කොටස : උතුරට : හරස් පාර ද, නැගෙනහිරට : කැබලි අංක 2 ද, දකුණට : ඩබ්ලිව්. ඩී. සොයිසා යන අයට හිමි පරිශ්‍ර අංක 3 ද, (අබේවික්‍රම මාවත) හා බටහිරට : ආර්. වී. පෙරුමයිනාර්ට හිමි වරිපනම් අංක 1 දරන පරිශ්‍රය (අබේවික්‍රම මාවත) වන එකී අංක 954 දරන පිඹුරට අනුව වන පර්චස් තිස් හතරයි දශම එකයි අටක් (අ. 0, රූ. 0, පර්. 34.18) වන කොටසින් වෙන් කරන ලද්දකි.

එම්. කේ. එල්. අබේරත්න,
රෙජිස්ට්‍රාර්,
නියෝජ්‍ය පිස්කල්/සාමවිනිසුරු,
දිසා අධිකරණය, ගල්කිස්ස.

2015 ක් වූ සැප්තැම්බර් මස 25 වැනි දින දී ය.

10-925

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.